සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

## පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

**I පත්‍රය**

**නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන**

# 7

# "අදිති"

පැය 01 යි

විභාග අංකය ..............................

**<u>විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්</u>**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 1-40 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

❖ අංක 1 සහ 2 ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට ගැළපෙන කොටස තෝරන්න.

01.






1)



2)



3)

02.




1)


2)



3)

❖ අංක 3 සහ 4 ප්‍රශ්නවල අනෙක් රූප දෙකට වඩා වෙනස් රූපය තෝරන්න.

**03.**


1)


2)


3)

04.



1)



2)



3)

❖ අංක 05 හා 06 ප්‍රශ්නවල සංඛ්‍යා රටා තේරුම් ගෙන හිස්තැන් පුරවන්න.

05.





1) 14
2) 21
3) 32

06.




1) 45, 74

2) 44, 74

3) 56, 63

❖ **පහත ගීතය කියවා ඒ ඇසුරින් 07 සහ 08 ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

***උදේ සුපිපුණු මලක් බඳු***
***ළපටි අත පය හුගක් මුදු***
***අම්මා හරි ආදරෙන් සැදූ***
***මාගේ නංගිගේ නමයි සුදූ***

07. මෙම ගීතයෙන් කියවෙන්නේ,

1) අම්මාගේ ආදරය ගැන ය.

2) හොඳින් පිපුණු මලක් ගැන ය.

3) නංගී ගැන ය.

08. මෙහි ' **මුදු** ' යන්නෙහි අදහස් වන්නේ,

1) මුද්ද යන්නයි 2) මෘදු බව යි. 3) මුහුණ යන්නයි.


09. 2021 වර්ෂයේ ජනවාරි 1 වෙනිදා බදාදා දිනයක් නම් එම වර්ෂයේ දෙසැම්බර් 31 වෙනිදා කවර දවසක් ද?

1) බදාදා 2) බ්‍රහස්පතින්දා 3) සිකුරාදා


10. විදේශගත ව රැකියාවක් කරන මනුකගේ පියා 2020 වර්ෂයේ දින 60ක නිවාඩුවක් සඳහා ලංකාවට පැමිණියේ ය. ඒ හරියටම මාස 2ක් සඳහා නම් ඔහු ලංකාවේ රැඳී සිටි මාස දෙක විය හැක්කේ,

1) ජූලි හා ජූනි 2) ජූලි හා අගෝස්තු 3) පෙබරවාරි හා මාර්තු

11. මෙම සෘජුකෝණාස්‍රය සකස් කර ඇත්තේ කම්බියකිනි. එය දිග හැරිය විට නවා ඇති ස්ථාන නිවැරදි දැක්වෙන කම්බිය තෝරන්න.



❖ **ළමයි තුන් දෙනෙක් A සිට B දක්වා දුර ගෙවා ගිය අයුරු පහත රූපසටහන මගින් දැක්වේ. එක් කොටුවක දිග 10m ක් වේ.**





12. මේ අනුව **දුර** අඩුම මාර්ගයේ ගිය ළමයා වන්නේ,

1) තරුෂ 2) මල්ෂ 3) මිනිදු

13. වැඩි ම දුරක් ගිය ළමයා වන්නේ,

1) තරුෂ 2) මල්ෂ 3) මිනිදු

❖ **පහත ඇති සම්බන්ධතාව අවබෝධ කරගෙන අංක 14 හා 15 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**




14. කෙසෙල් ඇවරියේ බර ප්‍රමාණය කොපමණ ද?

1) 1kg 2) 2kg 250g 3) 2kg 500g

15. මෙවැනි අඹ ගෙඩි දෙකක බර කොපමණ ද?

1) 2kg 500g 2) 5kg 3) 6kg 250g

❖ **16,17 ප්‍රශ්නවලය පිළිතුරු ලිවීමට පහත ඡේදය උපයෝගි කර ගන්න.**

යානයේ කුරුල්ලකු සිටින බව මා දැන ගත්තේ දවසක් මගේ ගබඩා ලැයිස්තුවක පරීක්ෂා කරමින් සිටිද්දීයි. A නාදයක් ඇසුණත් සිතුණේ එය යම්කිසි කියායි. එහෙත් B සංගීත රාවය නොනැවතුණු නිසා හිස බැලූ මා දුටුවේ මගේ කාමරේ ම සිටි ක්ලැරිබෙල් ය.

16. A හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

1) ගෙදර / ඉදිරියෙන් නැටුම් / පණිවිඩයක්

2) කාර්යාලයේ / පිටුපසින් සංගීත / ප්‍රකාශයක්

3) වැඩපළේ / පිටුබසින් මියුරු / වැඩක්


17. B හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.


1) මට / පුරුදු විදියට / ඔසවා


2) අපට / කරපු විදියට / දමා

3) මට / පෙර ආකාරයට / සොලවා

18. දකුණුපස ඇති ඝනවස්තුවක කඩ ඉරි දිගේ කැපූ විට දක්නට ලැබෙන මුහුණතේ හැඩය කුමක් ද?




1) 

2) 

3) 

19. මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීය ද?



1) 7කි

2) 10කි

3) 9කි

❖ **පහත සටහන අනුව 28 හා 29 ප්‍රශ්නවල පිළිතුරු තෝරන්න.**

■ x ■ = ▲

▲ + ▲ = ⬟

⬟ - 10 = 8

20. ■ හි අගය වන්නේ,

1) 4 2) 3 3) 9


21. ■ + ■ + ■ = ........ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

1) ⬟ - ▲ 2) 11 - ■ 3) ▲

22. මල් ප්‍රදර්ශනයක් දින 5ක් පුරා පැවැත් වේ. එය ජුලි 24 වන බදාදා ආරම්භ කරනු ලැබුවේ නම් ප්‍රදර්ශනය අවසන් වන්නේ කවදා ද?

1) ජුලි 28 වන ඉරිදා  2) ජුලි 29 වන සඳුදා  3) ජුලි 29 වන ඉරිදා

23. ලී කුට්ටියකින් සකස් කරන ලද මෙම සිලින්ඩරය ඇඳ ඇති රේඛාව දිගේ කැපූ විට ලැබෙන කොටස්වල ඇති මුහුණත් ගණන වන්නේ,



1) 6


2) 8

3) 4

24. අවරෝහණ පිළිවෙළට නිවැරදි ව ගළපා ඇති සංඛ්‍යා පේළිය වන්නේ,

1) ix, iv, vi, v  2) xv, xiii, ix, viii  3) xiv, xv, xix, xx

25. සමමිතික රේඛා වැඩිම සංඛ්‍යාවක් ඇඳිය හැකි හැඩතලය වන්නේ,

1)   2)   3) 

26. ඉටි පන්දමක් මිනිත්තු 20ක් දැල් වේ. ප.ව.7.00 ට එකවර දැල් වූ ඉටිපන්දම් 3ක් දැල් වී අවසන් වන්නේ කීයට ද?

1) ප.ව. 7.00ට  2) ප.ව. 7.30ට  3) ප.ව. 7.20ට

27. **''ජලය ඉහළට ගලා නොයයි''** මේ ප්‍රකාශය

1) සෑම විට ම අසත්‍ය වේ.

2) බෝහෝ විට අසත්‍ය වේ.


3) සෑම විටම සත්‍ය වේ.

28. තිනුරි ඉර බැස යන දිශාවට මීටර 15ක් ගමන් කර තම දකුණු අත පැත්තට හැරී මීටර 15ක් ගමන් කර නැවතත් දකුණු අත පැත්තට හැරී මීටර 30ක් ගමන් කළා ය. දැන් තිනුරිට ආරම්භක ස්ථානය පෙනෙන්නේ,

1) නිරිත දිශාවෙනි.  2) ඊසාන දිශාවෙනි.  3) දකුණු දිශාවෙනි.

29. රාක්කයක පෙට්ටි අසුරා ඇති තට්ටු දෙකකි. එහි ඉහළ තට්ටුවෙන් පෙට්ටි දෙකක් පහළ තට්ටුවට දැමූ විට තට්ටු දෙකේ ම පෙට්ටි ගණන සමාන වේ. ඒ අනුව ඉහළ හා පහළ තට්ටුවල මුලින් තිබූ පෙට්ට ගණන වන්නේ,

1) 4, 2  2) 6, 3  3) 5, 1

30. 

මෙම රූපයේ සෘජුකෝණ ගණන කීය ද?

1) 11

2) 8


3) 9

31. වෘත්තකාර උද්‍යානයක වැටේ ඇති කණු දෙකක් අතර මල් පෝච්චි 2 බැගින් තැබීමට අවශ්‍ය විය. එහි ඇති කණු ගණන 41ක් නම් අවශ්‍ය මල් පෝච්චි ගණන කීය ද?

1) 41 2) 80 3) 82

32. දිනෙත්මා, මිනෙත්මාගේ අක්කා ය. සන්දිල්, මිනෙත්මාගේ මල්ලී ය. සන්දිල්ගේ පුතා දිහාස් ය. දිනෙත්මාගේ ලොකු නංගී උමන්දිය ය. දිහාස්ගේ ලොකු නැන්දා කවුද?

1) දිනෙත්මා 2) මිනෙත්මා 3) උමන්දි

33. 

මෙහි ඇති සමචතුරස්‍ර ගණන කීය ද?

1) 20


2) 19

3) 12

34. 100cm දිග මිනුම් පටියක මැදින් 13cm ක් දිග කොටසකට හානි සිදුවිය. එම කොටස ඉවත් කර ඉතිරි කැබලි දෙකෙහි 5cm බැගින් එක මත අලවන ලදී. දැන් මිනුම් පටියේ දිග කොපමණ ද?

1) 87cm 2) 85cm 3) 82cm

35. පහත දැක්වෙන සටහන අනුව හිස්තැන් දෙකට ගැළපෙන රූප දෙක අයත් පිළිතුර තෝරන්න.




1)  2)  3) 


36. පිට්ටනියක පේළියට කොඩි සිටුවා ඇත. එහි හරි මැද ඇති රතුපාට කොඩිය 21 වන කොඩිය නම් පේළියේ ඇති කොඩි ගණන කීය ද?

1) 40 2) 41 3) 421

37. එක්තරා ගොවිපළක සිටින ගවයන්ගේ පාදවල හා හිස්වල එකතුව 45 කි. එහි සිටින ගවයන් ගණන කීය ද?

1) 12 කි  2) 9 කි  3) 10 කි

38. අඳුරු කළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියා ඇති පිළිතුර තෝරන්න.



1) $\frac{2}{8}$

2) $\frac{1}{4}$

3) $\frac{1}{8}$

39. කඩදාසි තීරුවක් කොටස් 5 ක් වන සේ නවා, සිදුරු කිහිපයක්විද ඇති අයුරු පහත දැක්වේ. මෙම කඩදාසි තීරුව දිග හැරිය විට දක්නට ලැබෙන සිදුරු ගණන කීය ද?



1) 25

2) 30

3) 36

40. මා ළඟ රුපියල් 270 ක් හා මල්ලී ළඟ රුපියල් 600 ක් ඇත. අප දෙදෙනා ළඟ ඇති මුදල් ප්‍රමාණය සමාන වීමට මල්ලීගෙන් මට තව කොපමණ මුදලක් ලැබිය යුතු ද?

1) රුපියල් 330  2) රුපියල් 165  3) රුපියල් 300